# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2016 නොවැම්බර් මස 25 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2016.11.25 දින නිකුත් කරන ලදී)**


# සංවර්ධන (විශේෂ විධිවිධාන)

**ශ්‍රී ලංකාවේ කඩිනම් ආර්ථික සංවර්ධනය ද ඇතුළුව සියලු විෂය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට පහසුකම් සැලැස්වීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

ගරු අග්‍රාමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 28.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

# සංවර්ධන (විශේෂ විධිවිධාන)

එල්.ඩී.–ඕ. 41/2016

**ශ්‍රී ලංකාවේ කඩිනම් ආර්ථික සංවර්ධනය ද ඇතුළුව සියලු විෂය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට පහසුකම් සැලැස්වීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

ලුහුඬු නාමය, ක්‍රියාත්මක වන දිනය සහ මෙම පනතේ කාලසීමාව.

1. (1) මේ පනත 2016 අංක දරන සංවර්ධන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

(2) මෙම පනතේ II, III, IV, V, VI, VII, VIIIසහ IX වන කොටස්වල විධිවිධාන නියමිත දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා බලාත්මකව පැවතිය යුතු යඃ

එසේ වුව ද, ඉහත කී කොටස් ක්‍රියාත්මකව පවතින අතරතුරදී ඒවායේ විධිවිධාන යටතේ කරනු ලබන ඕනෑම දෙයක්, ඉහත කී කොටස්වල සඳහන් විධිවිධාන ක්‍රියාත්මකවීම නොසලකමින් අඛණ්ඩව වලංගුව පවතින බවට සලකනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, (3) වන වගන්තියේ සඳහන් කොටස් ක්‍රියාත්මකවීම අවසන්වීමට පෙරාතුව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් දේපළ, කාර්ය මණ්ඩලය, ගිවිසුම්, වත්කම්, වගකීම් සහ මේ පනතේ ඕනෑම කොටසක් මගින් හෝ යටතේ පිහිටුවනු ලබන යම් නියෝජිත ආයතනයක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් විසින් හෝ එයට එරෙහිව ආරම්භ කරන ලද යම් නීති කෘත්‍යයක් රජයේ දෙපාර්තමේන්තුවක් හෝ ව්‍යවස්ථාපිත සංස්ථාවක් වෙත පැවරීම සඳහා විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

2—PL 004900—450 (2016/11)

## I වන කොටස

### I වන පරිච්ඡේදය

### ප්‍රතිපත්ති සංවර්ධනය

ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයක් පිහිටුවීම.

**2.** (1) අමාත්‍යවරයාට සහායවීම සඳහා ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලය, එය යටතේ ක්‍රියාත්මක වන විද්වත් කමිටුවක් විසින් අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳව, එනම්-

(අ) ප්‍රතිපත්ති සංවර්ධනය;

(ආ) ප්‍රතිපත්ති සමාලෝචනය; සහ

(ඇ) සම්පත් බෙදා වෙන් කිරීම,

පිළිබඳව වාර්තාවක් සකස් කර අමාත්‍යවරයා වෙත භාරදිය යුතු අතර අමාත්‍යවරයා විසින් ඒ පිළිබඳ ස්වකීය නිරීක්ෂණ සහිතව හෝ රහිතව, එම වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ ප්‍රධානියා පත් කිරීම.

**3.** (1) ප්‍රතිපත්ති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව නියම කරනු ලබන වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්දක් සහිත තැනැත්තකු ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ ප්‍රධානියා වන්නේ ය.

(2) ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ ප්‍රධානියා, ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර එම කාර්යාලයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනයට අවශ්‍ය සියලු කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ඔහු වගකියනු ලැබිය යුතු ය.

ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ කාර්ය මණ්ඩලය.

**4.** (1) ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස හා නිසි පරිදි ඉටුකිරීම සඳහා අවශ්‍ය බවට සලකනු ලබන යම් නිලධරයන් සහ සේවකයන් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ වෙනත් යම් විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයා විසින් -

(අ) ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ විනය පාලනය කිරීම හෝ ඔවුන් සේවයෙන් පහකිරීම ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය;

(ආ) එම නිලධරයන් සහ සේවකයන්ගේ වේතන, හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කරනු ලැබිය හැකි ය; හා

(ඇ) එම නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියම හා කොන්දේසි තීරණය කරනු ලැබිය හැකි ය.

ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවකයන් පත් කිරීම.

**5.** (1) ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ ද, එම නිලධරයා සේවයේ නියුක්ත කර ඇති හෝ නියුක්ත වන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද සහ රාජ්‍ය පරිපාලනය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලය විසින් තීරණය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා එකී කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනි ම කැමැත්තක් ඇතිව එකී කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අමාත්‍යවරයා විසින් අවස්ථානුකූල පත්වීම් කළ හැකි බව.

**6.** (1) ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලය යටතේ පිහිටුවන ලබන යම් කමිටුවක සේවය කිරීමට යම් නිශ්චිත කාලයක් සඳහා අමාත්‍යවරයා විසින්, කලින් කල,අවස්ථානුකූල පදනමක් මත අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වය සහ පළපුරුද්ද සහිත පුද්ගලයන් බවට හඳුනාගෙන සිටින තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන එකී ප්‍රවීණයන් සඳහා අදාළ වන නියම හා කොන්දේසි මෙන්ම වැටුප් සහ දීමනා මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ කර්තව්‍යය.

**7.** (1) ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි වේ; එනම්-

(අ) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව, අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බැලීම පිණිස ආර්ථික සංවර්ධනය ඇතුළු යම් විෂයයක් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සහ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා කෙටුම්පත් සැලසුම් කිරීම, සකස් කිරීම සහ වැඩි දියුණු කිරීම;

(ආ) එවැනි ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී, අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන අවස්ථාවන්හි දී සම්බන්ධීකරණය කිරීම සහ සහාය වීම,ප්‍රගතිය ඇගයීම, පහසුකම් සැලසීම සහ ප්‍රතිඵල ලබාගැනීමට ආධාර වීම;

(ඇ) යම් ආර්ථික හෝ සමාජීය අංශයක් විසින් අත්කර ගත යුතු වන සැබෑ ඉලක්ක සකස් කිරීම සහ ග්‍රාමීය නවීකරණය, ග්‍රාමීය නවීකරණයේ ප්‍රගතිය සහ සමාලෝචනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට මණ්ඩලය වෙත වාර්තා කිරීම ඇතුළුව එකී ඉලක්ක අත්කර ගැනීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම; සහ

(ඈ) යම් පළාතකට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් යම් රාජ්‍ය ආයතනයක සහ පළාත් පරිපාලනයක කාර්ය සාධනය පිළිබඳ ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා සහ ප්‍රධාන අමාත්‍යවරයා වෙත ස්වාධීන අදහස් පළ කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කර්තව්‍ය ඉටු කිරීමේ දී, -

(අ) අවස්ථාවෝචිත පරිදි, 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ග්‍රාමීය නවීකරණය පිළිබඳ මණ්ඩලය හෝ අදාළ කලාප සංවර්ධන මණ්ඩලය විමසීම;

(ආ) විශ්ව ආර්ථික, දේශපාලන, සාමාජයීය සහ පාරිසරික සංවර්ධන සහ ශ්‍රී ලංකාවට එහි බලපෑම සමාලෝචනය කිරීම;

(ඇ) නව අභියෝගවලට මුහුණදීම පිණිස ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රතිපත්ති යළිත් ශක්තිමත් කිරීමේ අරමුණින් ඒවා නැවත පරීක්ෂා කිරීම සහ විවේචනාත්මකව විශ්ලේෂණය කිරීම; සහ

(ඈ) රජය විසින් නිශ්චිතව දක්වනු ලබන ඉලක්ක සමඟ ප්‍රතිපත්ති අනුකූල බවට සහතික කිරීම,

ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ වගකීම වන්නේ ය.

ජාතික ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුතු බව.

**8.** (1) යම් විෂයයක් පිළිබඳව සකස් කරනු ලබන ජාතික ප්‍රතිපත්තියක් පිළිබඳ යෝජනා කෙටුම්පතක් සහ ජාතික ප්‍රතිපත්ති රාමුව අනුමතය සඳහා අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිය හා ජාතික ප්‍රතිපත්ති රාමුව අනුමත කිරීමෙන් පසුව, අමාත්‍යවරයා විසින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 9 වන වගන්තියේ සහ 10 වන වගන්තියේ විධිවිධානවලට අනුකූල විය යුතු ය.

(2) පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද යම් විෂයයක් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

## 2 වන පරිච්ඡේදය

## **ආර්ථික සංවර්ධනය**

ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ පරමාර්ථය.

**9.** ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ පරමාර්ථය වනුයේ සීඝ්‍ර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම වේ.

ආර්ථික සංවර්ධනය සඳහා වූ ප්‍රතිපත්ති රාමුව.

**10.** (1) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව සඳහා 9 වන වගන්තියේ දක්වා ඇති අරමුණු පැවතිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් කලින් කල සහ අවශ්‍ය අවස්ථාවල දී, ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලය විමසා, ජාතික ප්‍රතිපත්ති රාමුව සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම යෝජිත සංශෝධනයක් ම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව බලාත්මක වන්නේ ය.

(3) ජාතික ආර්ථික සංවර්ධනයට අදාළ ආණ්ඩුවේ සෑම සැලසුමක් ම, වැඩසටහනක් ම සහ යෝජනා ක්‍රමයක් ම ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූල විය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් එම සැලසුම, වැඩසටහන හෝ යෝජනා ක්‍රමය ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූල බවට සහතික කිරීම සඳහා අවශ්‍ය වන යම් ප්‍රතිපත්ති මාර්ගෝපදේශ, අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) අමාත්‍යවරයා විසින් සෑම වසරක දී ම මාර්තු මස තිස් එක් වන දිනයට පෙරාතුව එයට පූර්වගාමී වර්ෂයේ දී රටෙහි ආර්ථික සංවර්ධනය පිළිබඳව වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතු ය.

තොරතුරු ඉල්ලා සිටීමේ බලය.

**11.** අමාත්‍යවරයා විසින් බලය පවරනු ලබන ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ යම් නිලධරයකු විසින්, ආර්ථික ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සඳහා අවශ්‍ය බවට එකී නිලධරයා විසින් සලකනු ලබන යම් තොරතුරු සපයන ලෙස, ලිඛිතව, යම් තැනැත්තකු වෙත නියම කරනු ලැබිය හැකි අතර, වෙනත් යම් ලිඛිත නීතියක් මගින් එම තැනැත්තා වෙත පනවා ඇති යම් බැඳීමක් එකී තොරතුරු හෙළිදරව් කිරීම මගින් උල්ලංඝනය නොවන අවස්ථාවක දී, එකී නිවේදනයට එකඟව ක්‍රියා කිරීම, එකී නිවේදනය ලැබෙන තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

ආර්ථික සංවර්ධන ප්‍රදේශ.

**12.** (1) ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව පහත දැක්වෙන එක් හෝ වැඩි සංවර්ධන කටයුත්තක වේගවත් ආර්ථික වර්ධනයක් ඇති කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් අදාළ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විමසා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, යම් ප්‍රදේශයක් -

(අ) නිෂ්පාදන කටයුතු;

(ආ) සංචාරක කර්මාන්තය;

(ඇ) විද්‍යා හා තාක්ෂණ;

(ඈ) සම්පාදන;

(ඉ) ව්‍යාපාර සහ සේවා;

(ඊ) උසස් තාක්ෂණ ධීවර කර්මාන්තය; සහ

(උ) උසස් තාක්ෂණ කෘෂිකර්මය,

පිළිබඳ ආර්ථික සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් හඳුන්වනු ලබන ආර්ථික සංවර්ධනයක් උදෙසා වෙන් කරන ලද ප්‍රදේශයක් වශයෙන් නම් කරනු ලැබිය හැකි ය.

එවැනි සෑම නියෝගයක්ම මගින්, පාරිසරික සහ භූ ජල විද්‍යා අධ්‍යයනයන්ට යටත්ව, වෙනත් කරුණු අතර–

(අ) එකී ප්‍රදේශයේ සිදු කරනු ලැබිය හැකි එකක් ඊට වැඩි සංඛ්‍යාවක් වූ ආර්ථික සංවර්ධන කටයුතු;

(ආ) එවැනි කටයුතු මගින් අත්කරගනු ලැබිය යුතු පරමාර්ථ; සහ

(ඇ) එකී කටයුතු සඳහා සහායදිය යුතු රාජ්‍ය ආයතන,

නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක්ම එකී අනනුමතයේ දින සිට ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන සේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතුය.

(3) උසස් තාක්ෂණ කෘෂිකර්ම සංවර්ධනය වෙනුවෙන් සහාය ලබා ගැනීමට සුදුසුකම් ලබන සෑම ආර්ථික සංවර්ධන ප්‍රදේශයක් ම වගා කිරීම, නිෂ්පාදන ක්‍රියාවලිය, නිෂ්පාදනය, ගබඩා කිරීම සහ බෙදා හැරීමට අදාළ පිරිවැය ඵලදායීතාවක් සහතික කරනු ලැබිය හැකි ඉහළ මට්ටමක පැවතිය යුතු ය.

(4) උසස් තාක්ෂණ කෘෂිකර්ම සංවර්ධනය වෙනුවෙන් සහාය ලබා ගැනීමට සුදුසුකම් ලබන සෑම ආර්ථික සංවර්ධන ප්‍රදේශයකම පිහිටි ඉඩමක් (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියමයේ නිශ්චිතව දක්වා ඇති කෘෂිකාර්මික කටයුතු සඳහා මූලික වශයෙන් භාවිත කරනු ලැබිය යුතු අතර එවැනි ඉඩමක් කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා භාවිත කිරීම සීමා කරනු ලැබිය හැකි ය.

(5) උසස් තාක්ෂණ ධීවර කර්මාන්ත සංවර්ධනය වෙනුවෙන් සහාය ලබා ගැනීමට සුදුසුකම් ලබන සෑම ආර්ථික සංවර්ධන ප්‍රදේශයක්ම, වෙරළබඩ ධීවර කර්මාන්තය සහ ධීවර ගොවිතැන, අක්වෙරළ ධීවර කර්මාන්තය, ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තය සහ ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තය සඳහා වරාය ඉදි කිරීම, ධීවර නිෂ්පාදන සඳහා යටිතල පහසුකම්වල අගය වැඩි කිරීම සහ ධීවර නිපයුම් නිෂ්පාදන, ගබඩා කිරීම සහ බෙදාහැරීම පිළිබඳ පිරිවැය ඵලදායිතාවක් සහතික කරනු ලැබිය හැකි ඉහළ මට්ටමක පැවතිය යුතු ය.

ජාතික සැලසුම් සභාව පනත ඉවත් කිරීම.

**13.** 1956 අංක 40 දරන ජාතික සැලසුම් සභාව පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

## II වන කොටස

### 1 වන පරිච්ඡේදය

### සංවර්ධන නියෝජිත ආයතනය

සංවර්ධන නියෝජිත ආයතනය.

**14.** (මෙහි මින්මතු "නියෝජිත ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සංවර්ධන නියෝජිත ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන නියෝජිත ආයතනයක් තිබිය යුත්තේ ය.

නියෝජිත ආයතනයේ පරමාර්ථ.

**15.** පහත දැක්වෙන ආකාරයට අදාළ අධිකාරිය වෙත සහායවීම නියෝජිත ආයතනයේ පරමාර්ථ වන්නේ ය. එනම්,-

(අ) 10 වන වගන්තිය යටතේ අනුමත කරනු ලබන ජාතික ප්‍රතිපත්ති රාමුව තුළින් ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම, පුළුල් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ආ) පහත දැක්වෙන අරමුණුවලින් යුක්තව ශ්‍රී ලංකාවේ ආර්ථික පදනම ශක්තිමත් කිරීම; එනම්:-

(i) ආර්ථිකය නවීකරණය කිරීම;

(ii) ශ්‍රී ලංකාවේ භාණ්ඩ ගෝලීය අගය දාමයට ඇතුළත්වීමට ලෝක වෙළඳපොළ දී තරඟ කිරීමට හැකි තත්ත්වයට පත් කිරීම;

(iii) ශ්‍රී ලංකාවේ භාණ්ඩ සහ සේවාවල තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම;

(iv) වෙළඳපොළෙහි ප්‍රකෘති තත්ත්වය නිරූපණය නොවන වන පරිදි වෙළඳපොළ ගනුදෙනුකරුවන් අතර වංක සහයෝගය වැළැක්වීම සහ කුලී මුදල් අපේක්ෂාව වැළැක්වීම;

(v) සේවා නියුක්තිය ඇති කිරීම;

(vi) මහජනතාවගේ පුද්ගලික ආදායම වැඩි කිරීම;

(vii) වෙළඳාමේ තුලනය ප්‍රවර්ධනය කිරීම;

(viii) භාණ්ඩ සහ සේවා අපනයනය ප්‍රවර්ධනය කිරීම;

(ix) පාරිභෝගික සුභ සාධනය සහතික කිරීම;

(x) වෙළඳපොළෙහි දී සාධාරණ තරඟකාරීත්වයක් සහතික කිරීම;

(xi) නව්‍ය තාක්ෂණික ක්‍රම යොදවා ගැනීම මගින් ස්වකීය තාක්ෂණික කුසලතා සහ තාක්ෂණික දැනුම ඉහළ නැංවීම සඳහා ව්‍යවසායකයන් උනන්දු කරවීම;

(xii) කළමනාකාරීත්වය සහ තාක්ෂණික විශේෂඥ දැනුම ගොඩනැංවීම;

(xiii) මූල්‍යකරණය වෙත ප්‍රවේශවීමේ අවස්ථාව ලබාදීම;

(xiv) පරමාර්ථ අත්කර ගැනීමට අවශ්‍ය වන යටිතල පහසුකම් සහ වෙනත් සේවා සැපයීම; සහ

(ඇ) ආර්ථිකය මුහුණ දී සිටින තරඟකාරීත්වයට අදාළ ප්‍රධාන ගැටලු සහ අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර පිළිබඳ වාර්තා කිරීම.

නියෝජිත ආයතනයේ බලතල සහ කර්තව්‍ය.

**16.** (1) නියෝජිත ආයතනය විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව, ජාතික ප්‍රතිපත්ති රාමුව බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ වශයෙන් කෙටුම්පත් සැලසුම් හා යෝජනා ක්‍රම සකස් කර අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත ඒවා ඉදිරිපත් කරනු ලැබිය යුතු යඃ

එසේ වුවද, ග්‍රාමීය නවීකරණය පිළිබඳ සැලසුම්, වැඩසටහන් සහ යෝජනාක්‍රම, 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මණ්ඩලය වෙත පමණක් අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර්තව්‍ය ඉටුකිරීමේ දී, අදාළ කලාප සංවර්ධන මණ්ඩලය විමසීම නියෝජිත ආයතනයේ වගකීම වන්නේ ය.

(3) අවශ්‍ය අවස්ථාවල දී, නියෝජිත ආයතනය විසින් එම සැලසුම් හා වැඩසටහන් සඳහා, 12 වන වගන්තියේ සඳහන් එකී එක් එක් ආර්ථික සංවර්ධන භූමි ප්‍රදේශ, කලාපවලට බෙදා ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(4) නියෝජිත ආයතනය විසින්, අදාළ භෞතික සංවර්ධන සැලසුම් අධිකාරීන්ගේ එකඟත්වය ඇතිව එකී කලාප සඳහා භෞතික සංවර්ධන සැලසුම් ද සකස් කරනු ලැබිය යුතු ය.

(5) එවැනි සැලසුම් සහ වැඩසටහන් පළාත් සභාවලට අයත් විෂයයක් වන්නා වූ යම් විෂයයකට සම්බන්ධවන අවස්ථාවක දී, නියෝජිත ආයතනය විසින් ඒ සඳහා අදාළ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විමසිය යුතු ය.

(6) නියෝජිත ආයතනය විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව-

(අ) මේ වගන්තිය යටතේ අනුමත කරනු ලබන සැලසුම්, වැඩසටහන් සහ යෝජනා ක්‍රම අදාළ අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමේදී අදාළ අධිකාරිය වෙත සහාය ලබා දිය යුතු ය; සහ

(ආ) එකී සැලසුම්, වැඩසටහන් සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී, ඉල්ලා සිටිනු ලැබුවේ නම්, සම්බන්ධීකරණය කළ යුතු ය.

**ආර්ථික සංවර්ධන ප්‍රදේශ සම්බන්ධයෙන් නියෝජිත ආයතනයේ බලතල.**

**17.** (1) මේ පනතේ විධිවිධානවලට අනුව මේ පනත යටතේ ප්‍රකාශ කර ඇති ආර්ථික සංවර්ධන ප්‍රදේශ සම්බන්ධයෙන් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජිත ආයතනයට බලය තිබිය යුතු ය.

(2) නියෝජිත ආයතනය විසින් එවැනි යම් ප්‍රදේශයක් කලාප දෙකක් හෝ වැඩි ගණනක් වශයෙන් වෙන්කර දක්වනු ලැබිය හැකි අතර එකී එක් එක් කලාපය විසින් ඉටුකරනු ලැබිය යුතු කාර්ය පිළිබඳව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) නියමිත ආකාරයෙන් නියෝජිත ආයතනය විසින් බලපත්‍ර ප්‍රදානය කරනු ලබන මෙහෙය වන්නන් විසින් කලාප කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(4) යම් ආර්ථික සංවර්ධන ප්‍රදේශයක යම් වාණිජ ක්‍රියාකාරකමක් කිරීමට අපේක්ෂා කරනු ලබන යම් ව්‍යවසායක් විසින් එම ක්‍රියාකාරකම සිදු කිරීම සඳහා තම ව්‍යවසාය, නියෝජිත ආයතනය වෙත ලියාපදිංචිය කළ යුතු අතර ඒ සඳහා එම නියෝජිත ආයතනයෙන් සහතිකයක් ලබා ගත යුතු ය. නිකුත් කරන ලද එවැනි සියලු සහතික පිළිබඳ වාර්තාවක් නියෝජිත ආයතනය විසින් තබා ගත යුතු ය.

(5) (අ) ආර්ථික සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත භාරගනු ලබන යම් ව්‍යවසායක ආයෝජනය කිරීම සඳහා අපේක්ෂාවෙන් සිටින ආයෝජකයන් ලියාපදිංචි කිරීම සඳහා නියෝජිත ආයතනය වෙත බලය තිබිය යුතු ය.

(ආ) නියෝජිත ආයතනය විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් එකී ආයෝජකයන් ලියාපදිංචි කිරීම සඳහා වූ නිර්ණායක නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(6) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද,-

(අ) පහත නිශ්චිතව දක්වා ඇති යම් ලිඛිත නීතියක් මගින් යම් තැනැත්තකු, ආයතනයක් හෝ අධිකාරියක් වෙත පනවා ඇති හෝ පවරා ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය කිරීමේ දී ක්‍රියාත්මක කිරීමේ දී, හා ඉටු කිරීමේ දී නියෝජිත ආයතනය විසින් විධාන නිකුත් කිරීම නීත්‍යානුකූල විය යුතු අතර නියෝජිත ආයතනය විසින් කලින් කල ලබා දිය හැකි එකී විධානවලට එකඟව එම තැනැත්තා, ආයතනය හෝ අධිකාරිය විසින් ක්‍රියා කරනු ලැබිය යුතු ය.:-

(i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ආයෝජන මණ්ඩලය;

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය;

(iii) 2003 අංක 27 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පනත යටතේ පිහිටුවනු ලැබූ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය;

(ආ) මේ පනත යටතේ අනුමත කරනු ලබන සැලසුම් වැඩසටහන් හෝ යෝජනාක්‍රම කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මකවීම සහතික කිරීම සඳහා අවශ්‍ය බවට සලකනු ලබන මේ යටතේ නිශ්චිතව දක්වනු ලබන ආයතන සඳහා නියෝජිත ආයතනය විසින් විධාන ලබාදීම නීත්‍යානුකූල වන අතර එවැනි විධානවලට එකඟව ක්‍රියාකිරීම එකී ආයතනවල කාර්ය විය යුතු ය.

(i) ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ පිහිටුවනු ලැබූ සිවිල් ගුවන් සේවා අධිකාරිය;

(ii) ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා වරාය අධිකාරිය;

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සැපයුම් හා ජලාපවාහන මණ්ඩලය පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ජල සැපයුම් හා ජලාපවාහන මණ්ඩලය; සහ

(iv) 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයඃ

එසේ වුව ද, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගින් පිහිටුවනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරියෙන් විමසා සහ එහි එකඟත්වය ඇතිව මිස, නියෝජිත ආයතනය විසින් 1980 අංක 47 දරන ජාතික පරිසර පනත යටතේ වූ කිසිදු බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් කිරීම, ක්‍රියාත්මක කිරීම, හෝ ඉටු කිරීම නොකළ යුතු ය.

(7) කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තයේ ග්‍රාමීය නවීකරණයන්වල දී ඉහළ තාක්ෂණය යොදා ගැනීම සඳහා සංවර්ධන සැලසුම්, වැඩසටහන් සහ රීති සකස්කරනු ලබන අවස්ථාවක දී, නියෝජිත ආයතනය විසින් 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ග්‍රාමීය නවීකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වූ මණ්ඩලයේ අනුමතය ලබා ගත යුතු වේ.

(8) නියෝජිත ආයතනය විසින් එකී සැලසුම්, වැඩ සටහන් සහ රීති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව එම මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(9) එවැනි යම් ආර්ථික සංවර්ධන කලාපයක යම් ව්‍යාපාරයක් සංවර්ධනය කිරීමට ආයෝජන මණ්ඩලය විසින් අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී, ආයෝජන මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා නියෝජිත ආයතනය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර නියෝජිත ආයතනය විසින් ස්වකීය අනුමතය ප්‍රදානය කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එවැනි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලයේ බලතල නියෝජිත ආයතන විසින් සාදනු ලබන රීති හෝ සැලසුම්වලට යටත්ව සහ නියෝජිත ආයතනයේ අධීක්ෂණය සහ විධානවලට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(10) එවැනි යම් ආර්ථික කලාපයක ව්‍යාපාරයක් සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී, එම අධිකාරිය විසින් නියෝජිත ආයතනය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර නියෝජිත ආයතනය විසින් ස්වකීය අනුමතය ප්‍රදානය කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, 2005 අංක 38 දරන සංචාරක පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එවැනි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ බලතල නියෝජිත ආයතනය විසින් සාදනු ලබන රීති හෝ සැලසුම්වලට සහ නියෝජිත ආයතනයේ අධීක්ෂණය සහ විධානවලට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(11) අවස්ථාවෝචිත පරිදි, අවශ්‍ය අවස්ථාවල දී, පළාත් පාලන ආයතන සහ ආයෝජන මණ්ඩලය හෝ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අතර සම්බන්ධීකරණය කිරීමට නියෝජිත ආයතනයට බලය තිබිය යුතු ය.

(12) අදාළ විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් අදාළ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි ආයෝජන මණ්ඩලය වෙත හෝ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(13) වෙනත් අමාත්‍යවරයකු වෙත පවරා ඇති යම් විෂයයකට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් විධාන ලබා දෙන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් එකී වෙනත් අමාත්‍යවරයා විමසා එම කාර්යය සිදුකළ යුතු ය.

(14) 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම පිළිබඳ සීමා කිරීමේ) පනතේ විධිවිධාන මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන යම් ආයෝජකයකු සඳහා අදාළ නොවිය යුතු ය.

නියෝජිත ආයතනයේ කාර්ය මණ්ඩලය හා වගකීම්.

**18.** (1) නියෝජිත ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා වියයුතු නියෝජිත ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂවරයකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු අතර කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සුදුසුකම් සහ පළපුරුද්ද, පත්වීමේ නියම සහ කොන්දේසි නියම කරනු ලබන ආකාරයට වියයුතුය. කළමනාකාර අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු පාරිශ්‍රමික මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතුය.

(2) සංවර්ධන ක්‍රමෝපාය විෂයය භාර අමාත්‍යවරයා, කළමනාකාර අධ්‍යක්ෂවරයා සහ අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන වෙනත් තැනැත්තන් හයදෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වන්නාවූ නියෝජිත ආයතනයේ පොදු කටයුතු පිළිබඳ සභාවක් තිබිය යුත්තේය.

(3) පොදු කටයුතු සභාව විසින් නියෝජිත ආයතනයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය සම්බන්ධයෙන් වගකියනු ලැබිය යුතු ය.

(4) සංවර්ධන ක්‍රමෝපාය විෂය භාර අමාත්‍යවරයා පොදු කටයුතු සභාවේ රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට එකී අමාත්‍යවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී, කළමනාකාර අධ්‍යක්ෂවරයා එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. එකී අමාත්‍යවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා යන දෙදෙනාම යම් රැස්වීමකට පැමිණ නොසිටින අවස්ථාවක දී,පැමිණ සිටින සමාජිකයන් අතරින් තෝරාගනු ලබන යම් තැනැත්තකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(5) නියෝජිත ආයතනයේ බලතල සහ කර්තව්‍ය පොදු කටයුතු සභාවේ විධානය සහ පාලනය යටතේ කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතුය.

(6) සංවර්ධන ක්‍රමෝපාය විෂය භාර අමාත්‍යවරයා විසින් නියෝග මගින් පොදු කටයුතු සභාවේ ක්‍රියාකාරිත්වයට අදාළ වෙනත් යම් කරුණක් පිළිබඳ නියම කරනු ලැබිය හැකිය.

(7) පොදු කටයුතු සභාව විසින් අධ්‍යක්ෂවරුන් තිදෙනකු පත්කරනු ලැබිය යුතු අතර, ඔවුන්ගෙන් එක් අයකු 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මණ්ඩලයේ එකඟත්වය ඇතිව පත්කරනු ලැබිය යුතු අතර, කෘෂිකර්මය, ධීවර කර්මාන්තය සහ ප්‍රාථමික කර්මාන්ත සංවර්ධනය කිරීමට සහාය වීම ඔවුන්ගේ වගකීම විය යුතුය.

(8) ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමට අවශ්‍ය යම් නිලධරයන් සහ සේවකයන් සංඛ්‍යාවක් නියෝජිත ආයතනය විසින් පත්කරනු ලැබිය හැකි අතර ඔවුන්ට අදාළවන නියම සහ කොන්දේසි මෙන්ම ගෙවිය යුතු පාරිශ්‍රමික පිළිබඳව ද නියෝජිත ආයතනය තීරණය කරනු ලැබිය යුතුය.

බලතල බෙදීම.

**19.** නියෝජිත ආයතනය විසින් පොදුවේ ද සහ යම් ආර්ථික සංවර්ධන ප්‍රදේශයක් සම්බන්ධයෙන් විශේෂයෙන්ම ද ස්වකීය බලතල අදාළ කලාප සංවර්ධන මණ්ඩලය වෙත පවරනු ලැබිය හැකි ය.

වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව.

**20.** නියෝජිත ආයතනය විසින් සෑම මුදල් වර්ෂයක් අවසානයේ සිට මාස තුනක කාලයක් ඇතුළත පූර්වගාමී වර්ෂයේ දී සිදුකළ ස්වකීය කටයුතු පිළිබඳව විස්තර දක්වමින් අමාත්‍යවරයා වෙත වාර්තාවක් භාරදෙනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින් එම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතුය.

## III වන කොටස

### ග්‍රාමීය නවීකරණය පිළිබඳ මණ්ඩලය පිහිටුවීම

ග්‍රාමීය නවීකරණය පිළිබඳ මණ්ඩලය.

**21.** (1) පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන (මෙම පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ග්‍රාමීය නවීකරණය පිළිබඳ මණ්ඩලයක් පිහිටුවිය යුතු යː-

(අ) ජනාධිපතිවරයා;

(ආ) අග්‍රාමාත්‍යවරයා;

(ඇ) පිළිවෙළින් මූල්‍ය, ග්‍රාමීය ආර්ථික, ඉඩම්, සංවර්ධන ක්‍රමෝපාය සහ ජාත්‍යන්තර වෙළඳාම, කර්මාන්ත, කෘෂිකර්ම, ධීවර, වැවිලි කර්මාන්ත සහ සත්ත්ව පාලන විෂය භාර අමාත්‍යවරු;

(ඈ) සියලු පළාත්වල ප්‍රධාන අමාත්‍යවරු;

(ඉ) අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන වෙනත් සාමාජිකයන් හත්දෙනකු;

(ඊ) නියෝජිත ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂවරයා; සහ

(උ) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු උසස් තාක්ෂණ කෘෂිකර්මය, උසස් තාක්ෂණ ධීවර කර්මාන්තය සහ ප්‍රාථමික කර්මාන්ත සම්බන්ධයෙන් වගකිව යුතු අධ්‍යක්ෂවරයා.

(2) "ග්‍රාමීය නවීකරණය" යන යෙදුම සඳහා උසස් තාක්ෂණ කෘෂිකර්මය, උසස් තාක්ෂණ ධීවර කර්මාන්ත, අලෙවිකරණය, සම්බන්ධකතාව සහ අදාළ යටිතල පහසුකම් ඇතුළත් වේ.

**ග්‍රාමීය නවීකරණය පිළිබඳ මාර්ගෝපදේශ.**

**22.** මණ්ඩලය විසින් 16 (1) වන වගන්තිය යටතේ අනුමත කරනු ලබන ග්‍රාමීය නවීකරණය පිළිබඳ සැලසුම්, වැඩසටහන් සහ යෝජනා ක්‍රම, උසස් තාක්ෂණ කෘෂිකර්මය, උසස් තාක්ෂණ ධීවර කර්මාන්තය සහ ප්‍රාථමික කර්මාන්තවල ග්‍රාමීය නවීකරණය සඳහා මාර්ගෝපදේශයන් වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

**මාර්ගෝපදේශ නිකුත් කිරීමට ඇති බලය.**

**23.** (1) මණ්ඩලය විසින් නියෝජිත ආයතනය වෙත -

(අ) ග්‍රාමීය ආර්ථිකය, උසස් තාක්ෂණ කෘෂිකර්මය, උසස් තාක්ෂණ ධීවර කර්මාන්ත සහ ප්‍රාථමික කර්මාන්ත නවීකරණය කිරීම සහ ශක්තිමත් කිරීමට අවශ්‍ය නිර්ණායක සම්බන්ධයෙන්;

(ආ) ආර්ථික සංවර්ධන ප්‍රදේශ තුළ උසස් තාක්ෂණ කෘෂිකර්මය සහ උසස් තාක්ෂණ ධීවර කර්මාන්ත සම්බන්ධයෙන් නියෝජිත ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව;

(ඇ) ග්‍රාමීය ආර්ථිකයට අදාළ ක්‍රමෝපාය, සැලසුම්, වැඩසටහන් සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජිත ආයතනය සහ රජය මෙන්ම පළාත් පරිපාලනය අතර සම්බන්ධීකරණ කටයුතු සඳහා පහසුකම් සැලසීමට;

මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් එකී සැලසුම්, වැඩසටහන් සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මකවීම, අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම සිදු කළ යුතු ය.

## IV වන කොටස

## කලාප සංවර්ධනය

### කලාප සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව

*කලාප සංවර්ධන මණ්ඩල පිහිටුවීම.*

**24.** මේ පනතේ කාර්ය සඳහා කලාප සංවර්ධන මණ්ඩල පිහිටුවනු ලැබිය යුතු ය.

*කලාප සංවර්ධන මණ්ඩලවල පරමාර්ථ.*

**25.** කලාප සංවර්ධන මණ්ඩලවල පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යː-

(අ) රජයේ සහ පළාත් පරිපාලනයේ සංවර්ධන සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මකවීම කලාපීය මට්ටමින් සම්බන්ධීකරණය කිරීම සහ එකී සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම;

(ආ) නියෝජිත ආයතනයේ තීරණ සහ එය විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ප්‍රකාරව පෞද්ගලික අංශයේ ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී පහසුකම් සැලසීම.

*වසර 3 ක කලාප සංවර්ධන සැලසුම.*

**26.** (1) සෑම කලාප සංවර්ධන මණ්ඩලයක් විසින් ම රජය සහ පළාත් පරිපාලනය විමසා 2017, 2018 සහ 2019 වර්ෂ සඳහා එම කලාපයේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයන් සඳහා සියලු සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘතිවල වාර්තාවක් සකස් කරනු ලැබිය යුතු ය.

(2) එකී සියලු සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ජාතික ප්‍රතිපත්ති සහ ජාතික ඉලක්ක සමඟ අනුපූරක වන මෙන්ම අනුකූල වන බවට සහතික කිරීම සඳහා අදාළ කලාපීය සංවර්ධන මණ්ඩලය විසින් විමසීම් කරන එකී කාලය තුළ දී සියලු පියවර ගනු ලැබිය යුතු ය. වාර්තාවේ පරිශිෂ්ඨයේ ජාතික ප්‍රතිපත්ති සහ ඉලක්ක සමඟ අනුකූල නොවන සැලසුම්, වැඩසටහන් හෝ ව්‍යාපෘති පිළිබඳ සඳහන් විය යුතු ය. මෙම කාර්ය සඳහා කලාප සංවර්ධන මණ්ඩල විසින් ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ මතය සහ උපදෙස් ලබාගත යුතු ය.

(3) (අ) 10(3), 18(3), 23(2) සහ (25) යන වගන්ති යටතේ වාර්තාව සහ සැලසුම් සහ වැඩසටහන් මත පදනම්ව, අදාළ කලාපීය සංවර්ධන මණ්ඩලය විසින් අවශ්‍ය බවට සලකනු ලබන යම් ආර්ථික අනාවැකි ද සමගින් කලාපයේ එක් එක් දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් වූ සියලු සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ඇතුළත් කරමින් වසර තුනක ප්‍රධාන කලාප සංවර්ධන සැලසුමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එකී වාර්තාවට, රජය සහ පළාත් පරිපාලනයේ සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධයෙන් එක් එක් බලයලත් වියදම්, අරමුදල් මූලාශ්‍ර,සමාජ-ආර්ථික ප්‍රතිලාභ සහ ශක්‍යතාවය යන කරුණු අන්තර්ගත විය යුතු ය.

(ඇ) අදාළ ප්‍රධාන සැලසුමට ද 25(ආ) වගන්තිය යටතේ වූ සියලු ව්‍යාපෘති ඇතුළත් විය යුතු ය. එමගින් යම් දිස්ත්‍රික්කයක් තුළ පෞද්ගලික ව්‍යවසාය, උසස් තාක්ෂණ කෘෂිකර්මය සහ උසස් තාක්ෂණ ධීවර කර්මාන්ත වර්ධනය කිරීම සඳහා පහසුකම් සැලස්වීමට අවශ්‍ය පියවර නිර්දේශ කරනු ලැබිය යුතු ය. යම් සැලසුමක්, වැඩසටහනක් හෝ ව්‍යාපෘතියක් බැහැර කිරීම සම්බන්ධයෙන් ද හේතු ප්‍රධාන සැලසුමේ ද සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍ය මණ්ඩලය විසින් අදාළ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විමසා සංශෝධන සහිතව හෝ රහිතව වසර තුනක් සඳහා වූ කලාප සංවර්ධන ප්‍රධාන සැලසුම සඳහා අනුමතය ප්‍රදානය කරනු ලැබිය යුතු ය. 25 වන වගන්තියට අනුකූල නොවන්නා වූ සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ප්‍රධාන සැලසුමෙන් බැහැර කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍ය මණ්ඩලය විසින් කලින් කල අදාළ කලාප සංවර්ධන මණ්ඩලය සහ අදාළ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විමසීමෙන් පසුව එකී කලාප සංවර්ධන ප්‍රධාන සැලසුම සංශෝධනය කරනු ලැබිය හැකි ය.

වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම.

**27.** (1) කලාප සංවර්ධන ප්‍රධාන සැලසුම තහවුරුවීමෙන් පසුව අදාළ කලාප සංවර්ධන මණ්ඩලය විසින් එක් එක් දිස්ත්‍රික්කය සඳහා වාර්ෂිකව එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුමක් සහ ඇත්නම් ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන සැලසුමක් සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත භාර දෙනු ලැබිය

යුතු ය. අදාළ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විමසීමෙන් පසුව අමාත්‍ය මණ්ඩලය විසින් සංශෝධන සහිතව හෝ රහිතව එකී වාර්ෂික ක්‍රියාකිරීමේ සැලසුම සහ දේශීය ආර්ථික සැලසුම තහවුරු කරනු ලැබිය යුතු ය.

(2) කලාප සංවර්ධන ප්‍රධාන සැලසුම් සහ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම ක්‍රියාත්මක කිරීමේ දී සම්බන්ධීකරණය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලතල අදාළ කලාප සංවර්ධන මණ්ඩලයට තිබිය යුතු ය.

**රීති.**

**28.** (1) 25, 26 සහ 27 වන වගන්තිවල සඳහන් විධිවිධාන බලාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(2) පනතේ 26 සහ 27 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව විධායක බලතල ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සහා ජනාධිපතිවරයා විසින් යම් පළාතක ආණ්ඩුකාරවරයා වෙත විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

**කලාප සංවර්ධන මණ්ඩලවල බලතල, කාර්ය සහ කර්තව්‍ය.**

**29.** ස්වකීය අරමුණු ඉටු කිරීමේ කාර්ය සඳහා, යම් කලාප සංවර්ධන මණ්ඩලයක් විසින්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය හැර පහත දැක්වෙන සියලු හෝ යම් බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කරනු ලැබිය හැකි යː-

(අ) කලාප සංවර්ධන මණ්ඩලයේ පරමාර්ථ සපුරාලීමේ දී තාක්ෂණික සහ මූල්‍ය සහාය සහතික කිරීම සහ ලබා ගැනීම;

(ආ) අදාළ කලාපය තුළ අධ්‍යයන පැවැත්වීම සහ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය සහතික කිරීම;

(ඇ) අදාළ කලාපය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු රාජ්‍ය අමාත්‍යංශ, පළාත් පරිපාලන ආයතන සහ වෙනත් නියෝජිත ආයතනවලින් එම ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහාය වන ලෙස ඉල්ලා සිටීම;

(ඈ) අදාළ කලාපයේ ආර්ථික සහ සමාජයීය සංවර්ධනයට අදාළ පර්යේෂණ පැවැත්වීම;

(ඉ) යම් නිශ්චල දේපළක් මිලදී ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ලබා ගැනීම හෝ ලබාදීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම; සහ

(ඊ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, කලාප සංවර්ධන මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා හෝ මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ආනුෂංගික හෝ උපකාරකවන වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම.

කලාප සංවර්ධන මණ්ඩලය විසින් අරමුදල් වෙන් කළ හැකි බව.

**30.** (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, කලාප සංවර්ධන මණ්ඩලය විසින් ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ කාර්ය වෙනුවෙන් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව යම් රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තුවක් වෙත අරමුදල් වෙන්කර දෙනු ලැබිය හැකි අතර 34(4) වගන්තිය ප්‍රකාරව ලබා දෙන යම් විධාන යටතේ එකී කර්තව්‍ය ඉටු කිරීම සහ එම කර්තව්‍ය ඉටු කිරීමේ දී දරන ලද වියදම් ගණනය කිරීම අවස්ථාවෝචිත පරිදි, එම සංස්ථාවේ හෝ දෙපාර්තමේන්තුවේ කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අරමුදල් වෙන්කර දී ඇති යම් යම් සංස්ථාවක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් එම අරමුදල් වියදම් කිරීම පිළිබඳව කලාප සංවර්ධන මණ්ඩලය විසින් නියම කරනු ලබන යම් තොරතුරු සපයනු ලෙස එම සංස්ථාවට හෝ දෙපාර්තමේන්තුවට නියම කිරීම සඳහා යම් කලාප සංවර්ධන මණ්ඩලයක් වෙත හිමිකම් තිබිය යුතු අතර එම නියම කිරීමට එකඟව ක්‍රියා කිරීම එම සංස්ථාවේ හෝ දෙපාර්තමේන්තුවේ කාර්යය වන්නේ ය.

කලාප සංවර්ධන මණ්ඩල විසින් කාර්ය මණ්ඩලය පත් කිරීම.

**31.** (1) සෑම කලාප සංවර්ධන මණ්ඩලයක් විසින් ම ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය වන යම් නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය හැකි අතර ඔවුන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කරනු ලැබිය යුතු ය. එම නිලධරයන් සහ සේවකයන් පත් කිරීම සඳහා සහ ඒ පිළිබඳව 48 වන වගන්තියේ සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව උචිත පරිදි අදාළ කරගනු ලැබිය යුතු ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, එක් එක් කලාප සංවර්ධන මණ්ඩලය විසින් අවස්ථාවෝචිත පරිදි ක්‍රියාත්මක කළ යුතු හෝ සම්බන්ධීකරණය කළ යුතු ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(3) සෑම කලාප සංවර්ධන මණ්ඩලයක්ම නියෝජිත ආයතන විසින් කලින් කල, තමා වෙත නිකුත් කරනු ලබන ප්‍රතිපත්ති විධාන ප්‍රකාරව,ස්වකීය අධිකාරී බල ප්‍රදේශ තුළට ගැනෙන යම් ආර්ථික සංවර්ධන කලාපයක් සඳහා අනුමත කරනු ලබන සැලසුම් වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නියෝජිත ආයතනයේ විධානයට යටත්ව වගකියනු ලැබිය යුතු අතර නියෝජිත ආයතන විසින් එයට පවරා ඇති වෙනත් යම් බලතල එම කලාප සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන යම් සැලසුම්, වැඩසටහන්, යෝජනා ක්‍රම හෝ ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ මෙහෙයවීම සම්බන්ධයෙන් කලාප සංවර්ධන මණ්ඩල වගකියනු ලැබිය යුතු ය.

(5) පහත දැක්වෙන ආකාරයට නියෝජිත ආයතන විසින් ස්වකීය බලතල පවරා දෙනු ලැබිය හැකි යඃ-

(අ) යම් ආර්ථික සංවර්ධන ප්‍රදේශයක් සම්බන්ධයෙන්;

(ආ) එය විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරිදි වෙනත් යම් කාරණා පිළිබඳව, යම් කලාපීය සංවර්ධන මණ්ඩලයකට, එවැනි යම් බලතල පැවරීමක් ඒ බලතල ඍජුව ක්‍රියාත්මක කිරීමට නියෝජිත ආයතනයට ඇති අයිතියට බලපෑමක් නොවිය යුතු ය.

**32.** දක්ෂිණ සංවර්ධන මණ්ඩලය, වයඹ සංවර්ධන මණ්ඩලය, මධ්‍යම සංවර්ධන මණ්ඩලය, නැගෙනහිර සංවර්ධන මණ්ඩලය සහ උතුරු සංවර්ධන මණ්ඩලය විසින්, එහි එක් එක් අධිකාරී බල ප්‍රදේශ සම්බන්ධයෙන් 24 වන, 25 වන, 26 වන, 27 වන, 29 වන, 30 වන සහ 31 වන වගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංවර්ධන මණ්ඩලය විසින් බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

## V වන කොටස

### I වන පරිච්ඡේදය

### දක්ෂිණ සංවර්ධන මණ්ඩලය

**33.** (1) දක්ෂිණ කලාපය සඳහා වූ කලාපීය සංවර්ධන මණ්ඩලය, දක්ෂිණ සංවර්ධන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර එහි අධිකාරී බල ප්‍රදේශ ගාල්ල, මාතර, හම්බන්තොට, මොණරාගල සහ රත්නපුර යන පරිපාලන දිස්ත්‍රික්ක විය යුතු ය.

දක්ෂිණ සංවර්ධන මණ්ඩලය.

(2) දක්ෂිණ සංවර්ධන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) අමාත්‍යවරයා විසින් පත් කළ යුතු දක්ෂිණ කලාපීය සංවර්ධනය සඳහා වූ පරිපාලකවරයා දක්ෂිණ සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය;

(ආ) පිළිවෙළින් දකුණු පළාත් සභාවේ, සබරගමුව පළාත් සභාවේ සහ ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරු;

(ඇ) නියම කරනු ලැබිය හැකි, රාජ්‍ය සේවයේ වෙනත් යම් නිලධරයකු හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ සභාපතිවරයා; සහ

(ඈ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තන් තිදෙනෙක්.

(3) අමාත්‍යවරයා, දක්ෂිණ කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විය යුතු ය;

(4) දක්ෂිණ කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කල දක්ෂිණ සංවර්ධන මණ්ඩලයට ලිඛිතව උපදෙස් දෙනු ලැබිය හැකි ය.

(5) දක්ෂිණ කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයයක් මගින් දක්ෂිණ කලාපීය සංවර්ධන පරිපාලකවරයාගේ කර්තව්‍යයන් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(6) දක්ෂිණ සංවර්ධන මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් රාජ්‍ය නිලධරයන් සහ සේවකයන් දක්ෂිණ සංවර්ධන මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

2 වන පරිච්ඡේදය

**වයඹ සංවර්ධන මණ්ඩලය**

වයඹ සංවර්ධන මණ්ඩලය.

**34.** (1) වයඹ කලාපය සඳහා කලාපීය සංවර්ධන මණ්ඩලය වයඹ සංවර්ධන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර, එහි අධිකාරී බල ප්‍රදේශ පුත්තලම, කුරුණෑගල සහ කෑගල්ල යන පරිපාලන දිස්ත්‍රික්ක විය යුතු ය.

(2) වයඹ සංවර්ධන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයා සහ සාමාජිකයන් තිදෙනකු;

(ආ) වයඹ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා;

(ඇ) සබරගමු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා; සහ

(ඈ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් රාජ්‍ය නිලධරයන්.

(3) අමාත්‍යවරයා විසින් පත් කරන ලද වයඹ සංවර්ධන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයාට මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගීවීමේ අයිතිය තිබිය යුතු ය.

(4) වයඹ සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා වයඹ සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(5) අමාත්‍යවරයා, වයඹ කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විය යුතු ය.

(6) වයඹ කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කල වයඹ සංවර්ධන මණ්ඩලයට ලිඛිතව උපදෙස් දෙනු ලැබිය හැකි ය.

(7) වයඹ සංවර්ධන මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් රාජ්‍ය නිලධරයන් සහ සේවකයන් වයඹ සංවර්ධන මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

3 වන පරිච්ඡේදය

**මධ්‍යම සංවර්ධන මණ්ඩලය**

මධ්‍යම සංවර්ධන මණ්ඩලය.

**35.** (1) මධ්‍යම කලාපය සඳහා වූ කලාපීය සංවර්ධන මණ්ඩලය මධ්‍යම සංවර්ධන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර එහි අධිකාරී බල ප්‍රදේශ මාතලේ, නුවර, නුවරඑළිය සහ බදුල්ල යන පරිපාලන දිස්ත්‍රික්ක විය යුතු ය.

(2) මධ්‍යම සංවර්ධන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) අමාත්‍යවරයා විසින් එක් තැනැත්තකු සභාපතිවරයා වශයෙන් නම් කරනු ලැබිය යුතු, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්;

(ආ) මධ්‍යම, උතුරු මැද සහ ඌව පළාත් සභාවල ප්‍රධාන ලේකම්;

(ඇ) මධ්‍යම සංවර්ධන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා;

(ඈ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් රාජ්‍ය නිලධරයන්;

(3) මධ්‍යම සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා මධ්‍යම සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(4) අමාත්‍යවරයා, මධ්‍යම කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විය යුතු ය.

(5) මධ්‍යම කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කල මධ්‍යම සංවර්ධන මණ්ඩලයට ලිඛිතව උපදෙස් දෙනු ලැබිය හැකි ය.

(6) මධ්‍යම සංවර්ධන මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් රාජ්‍ය නිලධරයන් සහ සේවකයන් මධ්‍යම සංවර්ධන මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

4 වන පරිච්ඡේදය

## නැගෙනහිර සංවර්ධන මණ්ඩලය

නැගෙනහිර සංවර්ධන මණ්ඩලය.

**36.** (1) නැගෙනහිර කලාපය සඳහා වූ කලාපීය සංවර්ධන මණ්ඩලය, නැගෙනහිර සංවර්ධන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර එහි අධිකාරී බල ප්‍රදේශ අනුරාධපුරය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර යන පරිපාලන දිස්ත්‍රික්ක විය යුතු ය.

(2) නැගෙනහිර සංවර්ධන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) අමාත්‍යවරයා විසින් එක් තැනැත්තකු සභාපතිවරයා වශයෙන් නම් කරනු ලැබිය යුතු, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්;

(ආ) නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා;

(ඇ) නැගෙනහිර සංවර්ධන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා;

(ඈ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් රාජ්‍ය නිලධරයන්;

(3) නැගෙනහිර සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා, නැගෙනහිර සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(4) අමාත්‍යවරයා, නැගෙනහිර කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විය යුතු ය.

(5) නැගෙනහිර කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කල නැගෙනහිර සංවර්ධන මණ්ඩලයට ලිඛිතව උපදෙස් දෙනු ලැබිය හැකි ය.

(6) නැගෙනහිර සංවර්ධන මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් රාජ්‍ය නිලධරයන් සහ සේවකයන් නැගෙනහිර සංවර්ධන මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

5 වන පරිච්ඡේදය

**උතුර සංවර්ධන මණ්ඩලය**

උතුරු සංවර්ධන මණ්ඩලය.

**37.** (1) උතුරු කලාපය සඳහා වූ කලාපීය සංවර්ධන මණ්ඩලය උතුරු සංවර්ධන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර එහි අධිකාරී බල ප්‍රදේශ යාපනය, කිලිනොච්චිය, මන්නාරම, වවුනියාව සහ මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක විය යුතු ය.

(2) උතුරු සංවර්ධන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) අමාත්‍යවරයා විසින් එක් තැනැත්තකු සභාපතිවරයා වශයෙන් නම් කරනු ලැබිය යුතු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් සිවු දෙනෙක්;

(ආ) උතුරු පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් එක් තැනැත්තකු නියෝජ්‍ය සභාපතිවරයා ලෙස නම් කළ යුතු, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්;

(ඇ) උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා; සහ

(ඈ) නැවත පදිංචි කිරීමේ අධිකාරියේ සභාපතිවරයා;

(ඉ) අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් රාජ්‍ය නිලධරයකු හෝ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ නිලධරයකු.

(3) උතුරු සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා, උතුරු සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(4) අමාත්‍යවරයා, උතුරු කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විය යුතු ය.

(5) උතුරු කලාපීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කල උතුරු සංවර්ධන මණ්ඩලයට ලිඛිතව උපදෙස් ලබා දෙනු ලැබිය හැකි ය.

(6) උතුරු සංවර්ධන මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් රාජ්‍ය නිලධරයන් සහ සේවකයන් උතුරු සංවර්ධන මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

ප්‍රධාන පරමාර්ථ.

**38.** උතුරු සංවර්ධන මණ්ඩලයේ පරමාර්ථ, වෙනත් දේ අතරට උතුරු පළාතේ යුද්ධයෙන් හානියට පත් ආර්ථිකයේ පුනරුදයක් ඇති කිරීම සහ ආර්ථිකය නගා සිටුවීම විය යුතු ය.

## VI වන කොටස

### ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන නියෝජිතායතනය

ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන නියෝජිතායතනය.

**39.** ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන නියෝජිතායතනය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු නියෝජිතායතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සංයුතිය.

**40.** (1) ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනය පරිපාලන සහ කළමනාකරණ කටයුතු (මෙම කොටසේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන තැනැත්තන්ගෙන් මණ්ඩලය සමන්විත විය යුතු යః-

(අ) වාණිජ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ආ) ආනයන අපනයන පාලකවරයා;

(ඇ) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා;

(ඈ) තේ මණ්ඩලයේ සභාපතිවරයා;

(ඉ) ඒකාබද්ධ ඇඟලුම් අපනයනකරුවන්ගේ සංගමයේ සභාපතිවරයා;

(ඊ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු;

(උ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු;

(ඌ) ඒකාබද්ධ ඇඟලුම් අපනයනකරුවන්ගේ සංගමයේ නියෝජිතයකු; සහ

(එ) අමාත්‍යවරයා විසින් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් හය දෙනක්.

(2) සභාපතිවරයා මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගත් මණ්ඩලයේ සාමාජිකයකු විසින් එම රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

කළමනාකරණ අධ්‍යක්ෂවරයා සහ කාර්ය මණ්ඩලය.

**41.** (1) ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනය සඳහා කළමනාකරණ අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය යුතු අතර ඔහුගේ සුදුසුකම් සහ පළපුරුද්ද, පත්වීමේ නියම සහ කොන්දේසි, නියම කළ පරිදි විය යුතු ය. කළමනාකාර අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු පාරිශ්‍රමික මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය. කළමනාකාර අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු අතර ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනයේ කාර්ය මණ්ඩලයේ විනය පාලනය ද කළ යුතු ය.

(2) මණ්ඩලය විසින්, ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය හැකි ය.

ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතයාතනයේ පරමාර්ථ සහ කර්තව්‍ය.

**42.** (1) ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනයේ පරමාර්ථ-

(අ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම;

(ආ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවාවල, විශේෂයෙන් ම කෘෂිකාර්මික සහ ධීවර නිෂ්පාදනවල, අපනයනය වර්ධනය කිරීමට පහසුකම් සැලසීම;

(ඇ) ඉන්දියන් සාගර කලාපය තුළ ප්‍රධාන වෙළඳ, ව්‍යාපාර සහ සැපයුම් කේන්ද්‍රයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම; සහ

(ඈ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම විධිමත්ව සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා ආදර්ශ නියෝජිතායතනයක් ලෙස සේවය කිරීම.

(2) එහි කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනය විසින් ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ජාතික සැලැස්ම සහ අදාළ අනුමත සැලසුම්, වැඩසටහන් සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ යුතු අතර -

(අ) ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර වෙළඳාම වර්ධනය කිරීමට හිතකර වූ ව්‍යාපාරය සහ නියාමන වාතාවරණයක් නිර්මාණය කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ආ) (i) ශ්‍රී ලංකාවේ භාණ්ඩ සහ සේවාවලට ජාත්‍යන්තර වෙළඳපළට ප්‍රවේශවීමට පහසුකම් සැලසීම;

(ii) ජාත්‍යන්තර වෙළඳපළ තුළ ශ්‍රී ලංකාවේ භාණ්ඩ සඳහා පොදුවේ ද කාර්මික, කෘෂිකාර්මික සහ ධීවර නිෂ්පාදන සඳහා විශේෂයෙන් ද සහ සේවා සඳහා ද සාධාරණ සැලකිල්ලක් ලැබීම සහතික කිරීමට,

සඳහා පියවර නිර්දේශ කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ භාණ්ඩ සහ සේවා අපනයනය වැඩි කිරීමට පියවර නිර්දේශ කිරීම;

(ඈ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීමේ අරමුණින් අවශ්‍ය අවස්ථාවල දී රජයේ ආනයන සහ අපනයන ප්‍රතිපත්ති වෙනස් කිරීමට නිර්දේශ කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල් අතර වෙළඳ කටයුතු වල දී පැන නගින බුද්ධිමය දේපළ ගැටලු විසඳීම සඳහා පියවර නිර්දේශ කිරීම ; සහ

(ඊ) ලෝක වෙළඳ සංවිධානය තුළ ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.

(3) අමාත්‍යවරයා විසින් ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනයේ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයට සාමාන්‍ය හෝ විශේෂ විධාන ලබා දිය හැකි අතර මණ්ඩලය ඒ නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

නියෝග ලබා දීමේ බලතල.

**43.** (1) ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට, වාණිජ කටයුතු දෙපාර්තමේන්තුවට, ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවට, ශ්‍රී ලංකා තේ මණ්ඩලයටසහ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ජාත්‍යන්තර වෙළඳාමට අදාළ කර්තව්‍ය ඉටු කරන්නා වූ වෙනත් යම් දෙපාර්තමේන්තුවකට හෝ ආයතනයකට විධාන ලබා දීමට මණ්ඩලයට බලතල තිබිය යුතු අතර එකී දෙපාර්තමේන්තු හෝ ආයතන එම විධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

(2) නියමිත දිනයේ සිට සහ ඉන්පසුව -

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 16 වන වගන්තිය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට; සහ

(ආ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12 වන වගන්තිය මගින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට,

පනවන ලද හෝ පවරන ලද බලතල සහ කර්තව්‍ය, අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් හෝ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නොව ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනය විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(3) ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනය විසින්-

(අ) එහි යම් බලතල හා කර්තව්‍ය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ (එහි (2) වන උපවගන්තියෙන් බලය පවරනු ලැබ ඇති පරිදි) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට; සහ

(ආ) එහි යම් බලතල ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ (එහි (2) වන උපවගන්තියෙන් බලය පවරනු ලැබ ඇති පරිදි) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට,

නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව පවරනු ලැබිය හැකි ය.

(4) වාණිජ කටයුතු දෙපාර්තමේන්තුව විසින් බහු පාර්ශවික සහ කලාපීය වෙළඳ භාණ්ඩ ගිවිසුම් සාකච්ඡා කිරීමේ දී (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් දෙන ලද සියලු විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

අර්ථ නිරූපණය.

**44.** මේ කොටසේ "අමාත්‍යවරයා" යන්නෙන් සංවර්ධන ක්‍රමෝපායන සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

VII වන කොටස

**විධායක සම්මේලන**

විධායක සම්මේලන.

**45.** මේ පනත යටතේ සැලසුම්, වැඩසටහන්, යෝජනාක්‍රම සහ ව්‍යාපෘති සාකච්ඡා කිරීමට ජනාධිපතිවරයා විසින් වාර්ෂිකව කැබිනට් ඇමතිවරුන්ගේ, පළාත් ප්‍රධාන ඇමතිවරුන්ගේ සහ පාර්ලිමේන්තු ආංශීය කමිටුවල සභාපතිවරුන්ගේ සම්මන්ත්‍රණයක් කැඳවනු ලැබිය හැකි ය.

VIII වන කොටස

**ඇතැම් පනත් අදාළ කරගත හැකි බව**

නාගරික සංවර්ධන අධිකාරිය පනත සහ මහවැලි සංවර්ධන පනත අදාළ කර ගත හැකි බව.

**46.** (1) නියමිත දින සිට සහ ඉන් පසුව, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය විසින්-

(අ) මෙමපනත යටතේ අනුමත කරන ලද යම් සැලසුමක් වැඩසටහනක් හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ දී යම් ආකාරයකින් අහිතකර ලෙස බලපෑ හැකි ඒ පනතේ 8අ, 8ඇ, 8ඈ, 8ඉ, 8ඊ, 8ඌ, සහ 8ඒ යන වගන්ති යටතේ එහි බලතල ක්‍රියාත්මක නොකළ යුතු ය;

(ආ) එකී පනතේ යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද නියෝජිතායතනය විසින් එයට කරනු ලැබිය හැකි යම් විධානයකට අනුකූලව, මෙම පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද ආර්ථික සංවර්ධන ප්‍රදේශ සම්බන්ධයෙන් එම පනත යටතේ එය සතු බලතල ක්‍රියාත්මක කළ යුතුය.

(2) නියමිත දින සිට සහ ඉන් පසුව , 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින්,-

(අ) මෙම පනත යටතේ අනුමත කරන ලද යම් සැලසුමක්, වැඩසටහනක් හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ දී යම් ආකාරයකින් අහිතකර ලෙස බලපෑ හැකි ඒ පනතේ 22, 23, 24 සහ 25 වන වගන්ති යටතේ එහි බලතල ක්‍රියාත්මක නොකළ යුතු ය.

(ආ) එකී පනතේ යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද නියෝජිතායතනය විසින් එයට කරනු ලැබිය හැකි යම් නියෝගවලට අනුකූලව, මෙම පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද ආර්ථික සංවර්ධන ප්‍රදේශ සම්බන්ධයෙන් එම පනත යටතේ එහි බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජ්‍ය ආයතන විධාන පිළිපැදීමට බැඳී සිටින බව.

**47.** (1) නියමිත දින සිට සහ ඉන් පසුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මේ පනත යටතේ අනුමත කරන ලද සැලසුම්, වැඩසටහන් සහ යෝජනා ක්‍රමවලට අනුකූලව කටයුතු කළ යුතු අතර මේ පනත යටතේ අනුමත කරන ලද සැලසුමක්, වැඩසටහනක්, හෝ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී යම් ආකාරයකින් අහිතකර ලෙස බලපෑ හැකි 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ එය සතු බලතල ක්‍රියාත්මක නොකළ යුතු ය.

(2) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් එකී සැලසුම්, වැඩසටහන් හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට නියෝජිතායතනය මගින් නිකුත් කරන ලද සියලු විධානවලට අනුකූල විය යුතු ය.

(3) ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින්, ජාත්‍යන්තර වෙළඳාම සඳහා නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද සැලසුම් සහ විධානවලට යටත්ව එහි බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

(4) ජාත්‍යන්තර වෙළඳාම සඳහා වූ නියෝජිතායතනය නියෝජිත ආයතනයේ තීරණයන්ට, අනුකූල වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම කළයුතු ය.

## IX වන කොටස

### පොදු විධිවිධාන

රාජ්‍ය නිලධරයන් ද්විතීයනය කිරීම.

48. (1) මෙම පනත මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද නියෝජිතායතනයක, මණ්ඩලයක හෝ වෙනත් ආයතනයක ඉල්ලීම මත රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු එකී නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත මත කලාපීය සංවර්ධන මණ්ඩලය හෝ වෙනත් ආයතනයක් ඇතුළුව එම නියෝජිතායතනය, මණ්ඩලය හෝ වෙනත් ආයතන විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් සඳහා ඒ නියෝජිතායතනයේ හෝ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය නැතහොත් ස්ථිරව පත්කරනු ලැබිය හැකිය.;

(2) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු මෙම පනත මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද නියෝජිතායතනයක හෝ මණ්ඩලයක හෝ වෙනත් ආයතනයක කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු මෙම පනත මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද නියෝජිතායතනයක, මණ්ඩලයක හෝ වෙනත් ආයතනයක කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලබන අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අල්ලස් පනත අදාළ කර ගැනීම.

**49.** මෙම පනත මගින් හෝ එය යටතේ පිහිටුවන ලද සෑම නියෝජිතායතනයක්ම, මණ්ඩලයක්ම හෝ වෙනත් ආයතනයක් ම අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

සාමාජිකයන් සහ නිලධරයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**50.** මේ පනත මගින් හෝ එය යටතේ පිහිටුවන ලද සෑම නියෝජිතායතනයකම, මණ්ඩලයකම හෝ වෙනත් ආයතනයක සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙන් එය අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ ගනු ලබන නෛතික ක්‍රියාමාර්ග සඳහා වූ ආරක්ෂාව.

**51.** (1) කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක්-

(අ) මේ පනත යටතේ, නියෝජිතායතනයක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනක් විසින් සද්භාවයෙන් සිදු කරනු ලබන, සිදු කිරීමට අරමුණු කරන යම් ක්‍රියාවක් වෙනුවෙන් එකී නියෝජිතායතනයට, මණ්ඩලයට හෝ වෙනත් ආයතනයට එරෙහිව; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි, මෙම පනත යටතේ හෝ එය මගින් හෝ ඒ යටතේ පිහිටුවනු ලැබූ යම් නියෝජිතායතනයක, මණ්ඩලයක හෝ වෙනත් ආයතනයක විධානයක් මත එකී නියෝජිතායතනයේ, මණ්ඩලයේ හෝ වෙනත් ආයතනයක සාමාජිකයකු, නිලධරයකු හෝ සේවයකයකු හෝ අනුයෝජිතයකු සද්භාවයෙන් සිදු කරනු ලබන හෝ සිදු කිරීමට අරමුණු කරනු ලබන යම් ක්‍රියාවක් වෙනුවෙන් එකී නියෝජිතායතනයේ, මණ්ඩලයේ හෝ වෙනත් ආයතනයේ එකී සාමාජිකයාට නිලධරයාට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට එරෙහිව,

පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරිපිට දී නියෝජිතායතනය, මණ්ඩලය හෝ වෙනත් ආයතනය විසින් හෝ ඒවාට එරෙහිව ආරම්භ කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී එකී නියෝජිතායතනය, මණ්ඩලය හෝ වෙනත් ආයතනය විසින් දරන ලද වියදම් ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී නියෝජිතායතනය, මණ්ඩලය හෝ වෙනත් ආයතනය විසින් ගෙවන ලද හෝ අයකර ගන්නා ලද යම් මුදලක් එකී අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරන ලද එවැනි යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ නියෝජිතායතනයේ, මණ්ඩලයේ හෝ වෙනත් ආයතනයේ විධානය මත සිදු කරන ලද

හෝ සිදු කිරීමට අරමුණු කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට දී ඔහුට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඔහු විසින් දරන ලද යම් වියදමක් ඒ ක්‍රියාව සිදු කරනු ලැබුවේ සද්භාවයෙන් යැයි අධිකරණය පිළිගන්නේ නම් ඒ සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී ඔහු විසින් ඒ වියදම් අයකර ගෙන ඇත්නම් මිස, ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

නියෝග.

**52.** (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් (1) වන උපවගන්තිය යටතේ වන බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව මෙහි පහත දැක්වෙන සියලු කාරණා සම්බන්ධයෙන් හෝ ඉන් කවර වූ කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සාදනු ලැබිය හැකි ය.

(අ) මේ පනතින් යම් නියම කරනු ලබන්නා වූ යම් කාරණයක් නියම කරමින්; සහ

(ආ) යෝග්‍ය යැයි පෙනී යන්නා වූ පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන්,එනම්-

(i) මෙම පනත යටතේ අනුමත කරන ලද සැලසුම්, වැඩසටහන් සහ යෝජනා ක්‍රම සකස් කිරීමට පහසුකම් සැලසීම;

(ii) ප්‍රමාදයන් සහ පරිපාලන අවහිරතා පිටුදැකීම සඳහා විධිවිධාන සකස් කිරීම සඳහා සහ එකම ස්ථානයකින් ආයෝජන අනුමත ගැනීමට පහසුකම් සැලසීම;

(iii) නීතිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි බදු සහන ප්‍රදානය කිරීම සඳහා වූ නිර්ණායක, ක්‍රියාපටිපාටිය සහ අධිකාරී බලය නිශ්චිතව දැක්වීම;

(iv) ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ නීතිමය තත්ත්වය සහ එහි කාර්ය මණ්ඩලය පත් කිරීම සහ ඔවුන්ගේ පාරිශ්‍රමික මෙන්ම සුදුසුකම් ඇතුළුව ඒ කාර්යාලයට අදාළ සියලු කාරණා සඳහා;

(v) සාමාන්‍යයෙන් මෙම පනත යටතේ නියෝග සාදනු ලැබිය යුතු යැයි නියම කරන්නා වූ කාරණාවලට හෝ විෂයවලට ආනුෂංගික වන්නා වූ හෝ ඊට සම්බන්ධිත සියලු කාරණා සඳහා.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය පළ කරනු ලැබූ දිනයේ සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක දී සිට හෝ එය බලාත්මක විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් යම් උපකාරක නීතියකට අනනුකූලවන්නේ යැයි සොයා ගන්නා අවස්ථාවක ඒ නීතිය නියෝගයේ අනනුකූලතාවයේ ප්‍රමාණයට බලපැවැත්විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව හැකි ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) අනනුමතියේ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**53.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි - අර්ථ නිරූපණය.

"අමාත්‍යවරයා" යන්නට මේ පනතේ VI වන කොටසේ කාර්ය සඳහා හැර, ජාතික ප්‍රතිපත්තිය සහ ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා අදහස් වන අතර VI වන කොටසේ කාර්යය සඳහා "අමාත්‍යවරයා" යන්නෙන්, ක්‍රමෝපාය සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කිරීම අදහස් වේ;

"ලේකම්වරයා" යන්නෙන්, ජාතික ප්‍රතිපත්තිය සහ ආර්ථික කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා අදහස් වේ;

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**54.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.